## ඌවපරණගම ප්‍රාදේශීය සභාව

## 2022.03.10 වන දින පැවති මහ සභා වාර්තාව

**01.පිළිගැනීම**

මෙදින පෙ.ව.09.30 ට ආගම සිහි කිරිමෙන් පසු පැමිණ සිටි උප සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලය ද ඇතුළු සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**02.පැමිණීම .**

| | |
|---|---|
| 1. කේ.ඒ.සමින්ද සුදර්ශන මැතිතුමා | ගරු සභාපති |
| 2 ආර්.ඩී.ගුණපාල මැතිතුමා | ගරු උප සභාපති |
| 3. ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 4. ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. එම්. කාංචනා රුවන්මාලි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 6. ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. ඩී.එම්. තිලකරත්න බණ්ඩා මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. නාරායනන් වරදරාජ් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11 ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ආර්.එම් නාළිනි රාජපක්ෂ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 13. ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. ඩබ්.පී.සමන්ත වර්ණසූරිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එස්.එම්.සුජිත් ප්‍රසන්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. කේ.එම්.කරුණාතිලක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඩී.එම්. කරුණාදාස මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. එම්.ජී.ඒ සරත්චන්ද්‍ර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22. ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 23.එම්.එම් සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 24. කන්දසාමි පේරාම්බිගයි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 25. එම්.එම්.නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 26. ටී.බී. සුභසේන වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. එල්.එච්.ධර්මසේන මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 28. ඩබ්ලිව්.ජී.විජේසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. එස්.අඩෙයිකලම් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 30. ජී.දුලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 31 පුන්‍යදාස සුගුණකුමාර් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 32. ඩී.එම්.කමල් දේශප්‍රිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 33. ඩබ්.එම්. ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

34. ඩබ්.එම් ජයසේකර මැතිතුමා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
35. ටී.ඩබ්.ජී. උපසේන වැවේවත්ත මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම. –**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.කමල් දිසානායක මැතිතුමා විසින් අංක 09 යෝජනාව 2021.06.10 යෝජනා සම්මතය පරිදි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් බලපත්‍ර හිමිකාරිත්වය ලබා ගන්නා ආයතනයකට හෝ පුද්ගලයෙකුට ලබා දීමට ඒකමතිකව සභා සම්මත කර ඇති බවත් ඔහු ඒ සඳහා විරුද්ධ වු බවත් පවසා සිටින ලදි.

එහිදී ගරු සභාපතිතුමා විසින් මෙම යෝජනාව 2022 පෙබරවාරි මස සභා යෝජනාවලට ඇතුළත් කලත්, 2021.06.10 දින සභා සම්මත කරගෙන ඇති බැවින්, ඒ අනුව කටයුතු කිරිමට එකඟවු බවත්, ගරු මන්ත්‍රීතුමා යෝජනාව සභා සම්මත කරගන්නා අවස්ථාවේදී විරෝධතාවයක් නොදැක්වු බවටත් අදහස් දක්වන ලදි.

**සංශෝධන:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පුන්‍යදාස සුගුනුකුමාර් මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි,දෙමළ බසට පරිවර්තනය කල සභා වාර්තාවේ ළදරු පාසල් ගැන තියෙන යෝජනාවේ කමල් මන්ත්‍රීතුමා කතා කල ප්‍රකාශය සඳහන් වෙලා නැහැ.(සිංහල වාර්තාවේ 6 පිටුව - දෙමළ වාර්තාවේ 7 වැනි පිටුව)

2022.02.10 දිනැති මහා සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.ඒ. ශ්‍රීනාත් රාජිත මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් සංශෝධනයට යටත්ව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන :-**

- ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ 2021 වර්ෂයේ ද්‍රව්‍ය බෙදාදීම සඳහා දිනයක් සහ වේලාවක් යොදා ගන්නා මෙන් නිවේදනය කරනවා.

  මේ සඳහා 2022.03.21 වැනි දින ප.ව.2.00 ට ද්‍රව්‍ය බෙදා දීම සුදුසු බවට තීරණය කරන ලදි.

- වැලිමඩ,බදුල්ල පාර,ශිරෝමි ට්‍රේඩර්ස් වෙතින් වෙළඳපොලේ ලිට්රෝ ගෑස් මිල වැඩිවීම නිසා සපයනු ලබන ලිට්රෝ 37.5Kg ගෑස් සිලින්ඩරයක නව මිල 2022.03.03 වන දින සිට රු.10500.00ක් ලෙස දන්වා එවා ඇති බව නිවේදනය කරන ලදි.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය අසනිප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි,ඒ.පි.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා අසනිප තත්වයෙන් පසු වන බැවින් අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

පෙ.ව. 10.00ට ගරු ඒ.එම්.මංජු ප්‍රියනාත් මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන ලිපි;-**

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.කරුණාදාස මැතිතුමා -** ඉහල කොරදේකුඹුර, කොස්ගහතැන්න ගම්වාසීන් විසින් මැදහින්න ප්‍රාථමික විදුහල අසල සිට මැදහින්න මාර්ගය දක්වා මාර්ගය මැනීම් කටයුතු කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලද අතර 50% මූල්‍ය දායකත්වය මත මැනුම් කටයුතු කිරිම සඳහා ප්‍රදේශවාසීන්ට දැන්වීමට තීරණය කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ප්‍රියන්ත බණ්ඩාර මැතිතුමා : -**

ගරු සභාපතිතුමනි,කන්නය ඉවරවීමත් සමඟම කඳුවලට ඇති කරන ගවයින් ලිහා දානවා.මේ වෙනකොට සමෘද්ධියෙන් පැළ බෙදා දෙනවා ගෙවතු වගාවට.ගෙවතු වගාව තියා මල් පැළයක්වත් තියා ගන්න බැහැ.ග්‍රාම සේවා නිලධාරිතුමියත් දැනුවත් කලා. එතුමිය කියනවා හරක් ටික අල්ලලා දෙන්න කියලා. පොලිසිය හරි දැනුවත් කරලා ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ගවයින් ඇති කරන අය දැනුවත් කිරිමක් කල යුතුයි අනිවාර්යයෙන්ම.ඉදිරියේදී මැදවෙල හා කරගහඋල්පත ග්‍රාම සේවා වසම් දෙකේම සමිතිවලින් විශාල ලියුම් ප්‍රමාණයක් ලැබෙයි ඔබතුමාට. එක වසමක ඉන්නවා රජයේ නිලධාරින් 06ක් විතර. මම හිතන්නේ ඒ නිලධාරින්ගේ වගකීමක් මේක. ඒ නිසා හැකි ඉක්මනින් ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරලා මේ සඳහා පිළියමක් ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව උඩුකිඳ,මැදවෙල,එකමුතු සහන තරුණ සමිතියේ ලේකම් විසින් මැදවෙල හා කරගහඋල්පත ග්‍රාම සේවා වසම්වල ගවයින් නිදැල්ලේ සිටීමට ලිහා දැමීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස දන්වා එවා ඇති ලිපිය සභාගත කරන ලද අතර මේ සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන් දැනුවත් කිරිමට තීරණය කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩබ්.ජී. උපසේන වැවේවත්ත මැතිතුමා -** පන්නලගම ග්‍රාම සේවා වසමේ අඹගස්දෝව පන්නල හංදිය අසල පෙන්නා තිබෙන නාම පුවරුවේ සඳහන් කර ඇත්තේ දංගමුව, දවුල්දෙන, කරගහඋල්පත බැවින් එය පන්නල, තලාකුඹුර, දවුල්දෙන, කරගහඋල්පත වශයෙන් නිවැරදි විය යුතු බවට සඳහන් කර ඇති ලිපිය සභාගත කරන ලද අතර,අදාළ ආයතනය වෙත දන්වා යැවීමට තීරණය කරන ලදි.

**04.යථාපරිදි කල් දී ඇති ප්‍රශ්ණ :-** නැත

**05.යථාපරිදි කල් දීඇති යෝජනා :-**

**<u>යෝජනා අංක 01. - සමිති ලියාපදිංචි කිරීම.</u>**

2019.07.22 වන දින පැවති ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශය මත ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති මෙතෙක් ලියාපදිංචි නොකළ පහත නම් සඳහන් මරණාධාර/සුභ සාධක/අනෝන්‍යාධාර හා පරෝපාකාර සමිති ලියාපදිංචි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ. | **සමිතියේ නම හා ලිපිනය** |
|---|---|
| 01 | සඳමුතු යෞවන සමාජය සමිතිය,තෙල්හවඩිගම,මැදවෙල,උඩුකිඳ |
| 02 | එක්සත් සුභ සාධක කාන්තා සමිතිය,තවලම්පොල,ඌවපරණගම |
| 03 | සාරාංගා කලාසංසදය,තෙල්හවඩිගම,මැදවෙල |
| 04 | එක්සත් තරුණ සුභ සාධක සමිතිය,පන්නලගම,අඹගස්දෝව |

**<u>අංක 01 යෝජනාව සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමාගේ අංක 01 යෝජනාව සමිති ලියාපදිංචි කිරීම වෙනුවෙන් මේ වනවිට මුදල් බැද ඉල්ලුම්පත් සම්පූර්ණ කර ඇති එකමුතු සුභ සාධක සමිතිය,පන්සල පාර,සුමනජෝති මාවත,අඹගස්දෝව යන සමිතිය ඇතුළත් කිරීම සුදුසු බවට සංශෝධන ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධ වූ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමාගේ සංශෝධනයට යටත්ව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව සංශෝධනයට යටත්ව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 02 – ලුණුවත්ත අංක 29 කඩ කාමර පැවරීම</u>**

ලුණුවත්ත,ගල්තුඹ,අංක 29 දරන කඩ කාමරය දැනට ලුණුවත්ත,ගල්තුඹ,බෝගහවත්ත ලිපිනයේ පදිංචි ඒ.එම්.කලුබණ්ඩා යන අය නමින් පවතින අතර,ඔහු මියයෑම හේතුවෙන් ඔහුගේ බිරිඳ වන එම්.එම්.චන්ද්‍රලතා ශ්‍රියාවති මහත්මියගේ ඉල්ලීම අනුව ඇයගේ දියණිය වන ලුණුවත්ත,ගල්තුඹ,බෝගහවත්ත හි පදිංචි ඒ.එම්.සුරේකා මල්කාන්ති යන අයට මෙම ප්‍රාදේශීය සභාවේ පවත්නා ක්‍රමවේදයට අනුව පැවරුම් ගාස්තු ලෙස රු.20,000.00ක මුදලක් හා ඊට අදාල මුද්දර ගාස්තු අය කිරීමෙන් පසු පවරා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී,එම්.කාංචනා රුවන්මාලි මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද ලුණුවත්ත අංක 29 කඩ පැවරීම සම්බන්ධ වූ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය

**<u>යෝජනා අංක 03 – මොරගොල්ල බ්‍රොෆින්වත්ත ඉඩම් කොටසේ වැට ගැසීම</u>**

2021.08.23 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශය පරිදි මොරගොල්ල බ්‍රොෆින්වත්ත ඉඩම් කොටසේ වැට ගැසීම සඳහා ඉදිරිපත් කර තිබූ රු.490,000.00ක ඇස්තමේන්තුව 2021.10.04 දින පැවති මහ සභාවේ දී අනුමත කරන ලදි.

එහෙත් භාණ්ඩවල වෙළඳපල මිළ ඉහල යාම මත එම මුදලින් කාර්යය ඉටුකර ගැනීමට නොහැකිවීම මත නැවත සකස් කරන ලද රු.785,000.00ක ඇස්තමේන්තුව අනුමත කර එකී කාර්යය සිදු කර ගැනීමටත්,කාර්යය අවසන් කිරිමෙන් පසු සභා අරමුදලින් මුදල් ගෙවීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ගරු සභාපතිතුමනී, මෙම කාර්යය සෘජු කර්මාන්තයක් ලෙස හෝ කඩිනමින් ඉටු කර ගනිමු.

**<u>යෝජනා අංක 04 – 2022 අප්‍රේල් මස මහ සභාව පැවැත්වීම</u>**

පෙර නියම කරගත් පරිදි සෑම මසකම දෙවන බ්‍රහස්පතින්දා දිනයේ දී මාසික මහ සභා රැස්වීම පැවැත්විය යුතු වුවද 2022 අප්‍රේල් මස දෙවන සතියේ බ්‍රහස්පතින්දා දිනයට සිංහල අලුත් අවුරුද්ද යෙදී ඇති බැවින්, එම දිනය රජයේ නිවාඩු දිනයක් වන අතර, එදිනට පැවැත්වීමට නියමිත මහ සභා රැස්වීම 2022 අප්‍රේල් මස 07 වැනි බ්‍රහස්පතින්දා දින පැවැත්වීම සුදුසු බවටත්,පසුව යෙදෙන සෑම මසකම පෙර නියම කරගත් පරිදි සෑම මසකම දෙවන බ්‍රහස්පතින්දා දිනයේ දී මාසික මහ සභාව පැවැත්වීම සුසුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී.එම්.කරුණාදාස මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සහා සම්මත විය

**<u>යෝජනා අංක 05 – ප්‍රජා මණ්ඩල ස්ථාපනය කිරිම</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කර්තව්‍යයක් වන පොදු උපයෝගී සේවාවන් වඩාත් පහසු කරවීම පිණිස බල ප්‍රදේශයේ සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ප්‍රජා මණ්ඩල පිහිටුවා පවත්වාගෙන යාම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවාත් සමගම කඩිනමින් වැඩ පිළිවෙලක් යොදලා ක්‍රියාත්මක කිරිමටත් අවශ්‍ය කටයුතු සලසමු කියා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර රාජපක්ෂ මැතිතුමා :-**

ගරු සභාපතිතුමනී, මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරිමක් කරන්න.

**ගරු සභාපති තුමා :-**

ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවානේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන සමිති. ඒ වගේම ප්‍රාදේශීය සභා පනතේ අපට එවැනිම බලයක් සහිතවූ සංවිධානය තමයි ප්‍රජා මණ්ඩලය. ඉස්සර තිබුණා. මගේ ගමේ තාමත් තියෙනවා සීල් එකයි, ඩොලක්කයක් ගාමිණී ප්‍රජා මණ්ඩලය කියලා. ප්‍රජා මණ්ඩල ගොඩාක් සක්‍රීය කාලයක් තිබුණා ඇත්තටම.අපේ ප්‍රාදේශීය සභා පනතේ තියෙන කාර්යයක්.පොදු උපයෝගීතා, මංමාවත්,සෞඛ්‍යය ක්‍රියාත්මක කරනකොට අපට නිරන්තරයෙන්ම කියනවා අපේ අයවැය සකස් කරනවිටත් ප්‍රජා සහභාගීත්ව අයවැය කරණයක් කරන්න කියලා. අපට මේවා නැවත බලගන්වන්න කියලා ව්‍යාපෘතියකින් හඳුන්වලා දීලා තියෙනවා. උදාහරණයක් විදිහට අපට දැන් පැන නැගුන කම්බි වැට ගැසීම සම්බන්ධව.ඩවුන්සයිඩ්එකේ අපේ ප්‍රජා මණ්ඩලයක් තිබුණා නම් එයාලට අපි කියනවා මේක අරන් කරන්න කියලා. අපට නීත්‍යානුකූල බලයක් තියෙනවා ගොවි සංවිධානයට,ග්‍රාම සංවර්ධන සමිතියට අමතරව ප්‍රජා මණ්ඩලයට ගිවිසුම්ගත වෙන්න. ප්‍රජා මණ්ඩල පිහිටුවීම දිස්ත්‍රික්කය පුරාම ක්‍රියාත්මක වෙනවා. ප්‍රජා මණ්ඩල පිහිටුවා ඉවර වූ පසු ප්‍රජා මණ්ඩලත් කර්මාන්ත ලේඛනයට ඇතුළත් කරන්න කියන ඉල්ලීම දිස්ත්‍රික් ලේකම්තුමියගෙන් කිරිමට බලාපොරොත්තු වෙනවා.ප්‍රජා මණ්ඩල පිහිටුවීම අපට බොහොම ප්‍රයෝජනවත් කාරණයක්. උදාහරණයක් විදිහට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මොන දේ තිබුණත් ග්‍රාම සංවර්ධන සමිති රැස් කලාම ලොකු දෙයක් කරන්න පුළුවන්. එදා අපි ධර්ම පුස්ථකය එළි දැක්වූ වෙලාවේ දී ග්‍රාම සේවා වසම් හැට අටේම(68) ප්‍රජා මණ්ඩල හදලා තිබුණා නම් එක වසමකින් දෙදෙනෙකු බැගින් සහභාගි වුණා නම් 126ක් සහභාගි වෙනවා.

ඒවගේම ප්‍රජා මණ්ඩලයට ද්‍රව්‍ය බෙදා දීමට ප්‍රතිපාදන වෙන් කිරිමේදීත් කිසිම ගැටළුවක් නැහැ.අපට ප්‍රජා මණ්ඩල සඳහා පුහුණු නිලධාරියෙක් ලෙස අමිල මහත්මා කටයුතු කරනවා. අපට වසම් 68ම එකවර පටන් ගන්න හැකියාවක් නැහැ. ඒ නිසා වසමක දෙකක පටන් අරගෙන කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ උනන්දුව මත සියලුම ග්‍රාම නිලධාරි වසම්වල ආරම්භ කරමු. අනාගතයේ දී එය ඉතාම වැදගත් වෙයි. ඉස්සර මේ ප්‍රජා මණ්ඩල අතර තරඟ තිබුණා. තරුණ ප්‍රජා මණ්ඩල තිබුණා. එදා තිබුණ සමාජය වට පිටාවත් එක්ක ගොඩාක් සමීපයි. උදාහරණ විදිහට සංගීත කණ්ඩායම්/තරුණ ගොවි කණ්ඩායම් වගේ දේවලුත් තිබුණා. ගෙවතු වගා තරඟ ආදිය ක්‍රියාත්මක කරන්න පුළුවන් වසම් 68ම පිහිටුවානම්.ග්‍රාම සංවර්ධන සමිතියේ දැනට තියෙන්නේ සීල් එකයි නිලධාරි දෙන්නයි විතරනේ. එහෙමත් තැනක තමයි ග්‍රාම සංවර්ධන සමිතිය රැස්වෙලා පවත්වාගෙන යන්නේ. මේක එහෙම එකක් නෙවෙයි. ගමේ ක්‍රියාකාරි විදිහට හොඳ ප්‍රජා මණ්ඩලයක් හදාගන්න හැමෝම තමන්ගේ වසමට. කාටවත් හොඳක් මිස නරකක් සිද්ධ වෙන්නේ නැහැ.

**06.කාරක සභා වාර්තා සලකා බැලීම -**

- ❖ **මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව සලකා බැලීම:-**

2022 පෙබරවාරි 25 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තා සලකා බලා එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

- ❖ **2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සලකා බැලීම :-**

2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සලකා බලා එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**07.ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන සලකා බැලීම :-**

2022.02.01 දින සිට 2022.02.28 දින දක්වා වන මාසික ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශනය සලකා බලා අනුමත කරන ලදි.

**මිළ ගණන් විවෘත කිරිම**

**I. මුද්‍රණ යන්ත්‍ර සඳහා මිළ ගණන්**

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | ඊසි ටෙක්නොලජී, වැලිමඩ | නිට්රෝ IT සොලියුෂන්, නුගතලාව | යුනිටි නෙට්වර්ක්ස්, වැලිමඩ |
| 1 | Jolimark D.P.350 මුද්‍රණ යන්ත්‍රය හෝ ඊට සමාන මුද්‍රණ යන්ත්‍ර 01ක් සඳහා මිළ(4 Ply) | Epson LQ 310 80000.00 | Epson LQ 310 72000.00 | Epson LQ 310 78000.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති නිට්රෝ IT සොලියුෂන්, නුගතලාව වෙතින් ද්‍රව්‍ය සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**08.වෙනත් කරුණු :-**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ආර්.ඩී.ගුණපාල මැතිතුමා : -**

මැදගොඩගම වසමෙත් ගවයින් නිදැල්ලේ දැමීමේ ගැටළුව තියෙනවා. පස සංරක්ෂණය කරලා වල් හදලා තිබුණා. ඒ සේරම විනාශ කරලා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා : -** ගරු සභාපතිතුමනී, අඹගස්දෝව ක්‍රීඩාංගනය ගැන පොඩි ප්‍රශ්නයක් තියෙනවා. දෙළුම්ගහවත්ත ක්‍රීඩාංගනය කියන නම යන්නේ නැහැ. හැමෝම කියන්නේ ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය කියලා. දෙළුම්ගහවත්ත ක්‍රීඩාංගනය කියන නම ඉස්සරහට අරගෙන යන්න ක්‍රීඩාපිටිය වෙන්කරනකොට දැනුවත් කරන්න පෝස්ටර් ගහන්න කියන්න මේ නමින්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,පුනාදාස සුගුනු කුමාර් මැතිතුමා : -** පහුගිය දවසේ වැස්සත් එක්ක ගම්පහවත්ත පහල කොටසේ ප්‍රධාන පාරේ ලොකු වංගුවත් බැම්මත් එක්ක කඩාගෙන ගියා. වාහන යන්නත් අමාරුයි.විශාල ගල් පෙරලිලා. පුළුවන්නම් සභාවෙන් ජේසිබී යන්ත්‍රය යොදවලා හරි ගල් ටික අයින් කරලා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා : -**

ගරු සභාපතිතුමනී, උපසේන මන්ත්‍රීතුමා පෙන්වා දීපු කාරණය හොඳයි.මේ බෝඩ්වල නම් සඳහන් වෙන්නේ කුඩා ප්‍රමාණයෙන්. පැහැදිලි නැහැ. වැරදි නාම පුවරු සවි කිරීම සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කිරීමේ දී මේ සම්බන්ධවත් දැනුවත් කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එස්.එම්.සුජිත් ප්‍රසන්න මැතිතුමා : -**

ගරු සභාපතිතුමනී,ලුණුවත්ත ජාතික පාසල ළඟ සවිකරලා තියෙන බෝඩ් එක බෝකොටුතැන්න මාර්ගය කියන එක සඳහන් වෙන්න ඕන බෝකොටුතැන්නට හැරෙන මාර්ගය ළඟනේ. එහෙත් ගහලා තියෙන්නේ බෝල පිට්ටනියට මෙහා පැත්තේ. තුංමංසන්ධියෙන් පාරවල් බෙදෙනවා. හිතා ගන්න බැහැ බෝකොටුතැන්නට යන මාර්ගය මොකක්ද කියලා. බෝඩ් එක සවිකරලා තියෙන්නේ මීටර් 50ක් විතර දුරින්.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ආර්.ඩී.ගුණපාල මැතිතුමා : -**

මේ දිනවල වෙළඳපලේ සිමෙන්ති හිඟයක් පවතිනවා.ඒ නිසා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අපහසුතාවයක් පවතිනවා. සමහර වෙළඳ ප්‍රජාව වැඩි මිලට සිමෙන්ති අලෙවි කරනවා. ගිය සතියේ රෑ දෙකට තමයි වැලිමඩ සෙඩ් එකෙන් කතාකරලා තියෙන්නේ ඉන්දන ගෙනියන්න. ඒ වෙලාවේ පුළුවන් තරම් දීලා තියෙනවා. වෙළඳපලේ අපි නොසිතන ගැටළු ව්‍යාපාරිකයින් විසින් හදාගෙන ඉන්නවා.අපට දිස්ත්‍රික්ක ලේකම්තුමියත් එක්ක තිබුණ සාකච්ඡාවේ දී දැනුවත් කලා සිමෙන්ති සමූපකාර සමිතිවලට හරි ලබලා දීලා අවශ්‍ය කරන සිමෙන්ති හිඟයකින් තොරව මේ සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන්න කියලා ඉල්ලීමක් කලා. මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් නැවත දිස්ත්‍රික් ලේකම්තුමියගෙන් සිහිකැඳවීමක් කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා : -**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මටනම් ස්තුතියක් කරන්න තමයි තියෙන්නේ. අපි මේ පුංචි කෙටි කාලය තුළදී ප්‍රාදේශීය සභා මහජන නියෝජිතයින් විදිහට පත්වෙලා ඇවිල්ලා අපට කීර්ති නාමයක් ගෙන දුන්නාට කෘතගුණ සැලකීමක් විදිහට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. පසුගිය සතියේ ධර්ම පුස්ථකය එළි දැක්වූවා ලුණුවත්ත නගරයේ දී. ඔබතුමා අපි ගැනත් සඳහන් කරලා තිබුණා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ආර්.ඩී.ගුණපාල මැතිතුමා : -**

උදේ මම විහාරස්ථානයට ගිය අවස්ථාවේදී ධර්ම පුස්ථකය එළිදැක්වීම සම්බන්ධයෙන් ස්වාමීන් වහන්සේලාගේ ප්‍රශංසාව පල කලා. අපේ ඉතිහාසය තුළවත් මේ වගේ කටයුතු ක්‍රියාත්මක කරලා නැහැ අපි. ඉදිරියේදීත් මෙවැනි කටයුතු කරගෙන යාම සඳහා ශක්තිය,ධෛර්යය,ආශිර්වාදය ඔබතුමාට ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. මෙවැනි දේ හඳුන්වා දීම තුළින් අපේ ආගම පිළිබඳව ඇති භක්තිය වර්ධනය වෙනවා.ඒ අවස්ථාවේ ඌවපරණගම බල ප්‍රදේශය තුළ ඉතාමත් දක්ෂ වගේම කථිකාචාර්යවරු විදේශ රටවල පවා ධර්මය ප්‍රචාරය කරන නායක හාමුදුරුවන් වහන්සේලාගේ ආශිර්වාදය හා අදහස් උදහස්වලට අපට අවස්ථාව උදාවුණා. ඉදිරියේදීත් අපේ ප්‍රදේශය තුළ සිටින උගතුන් සහ බුද්ධිමතුන් කියන පිරිස් එකම මණ්ඩපයකට ගෙනල්ලා මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන්න.ඔබතුමාට මම සියලුම විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලාගේ ගෞරවනීය ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි,ඊ. සෝමා එදිරිසිංහ මැතිතුමිය: -**

ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසරයි. මම ඊයේ ප්‍රාදේශීය ලේකම්තුමිය මුණ ගැහෙන්න ගිය අවස්ථාවේදී එතුමිය අපේ ප්‍රාදේශීය සභාව ගැන ගොඩාක් දේවල් කතා කලා. අන්තිමට එතුමිය ප්‍රකාශයක් කලා. මට ඒ වෙලාවේ ඇතිවුණ සතුට මගේ දේශපාලන ජීවිතයේ කවදාවත් ලබලා නැහැ. එතුමිය කීවා මේ වර්තමාන සභාපතිතුමා යන්න ඉස්සෙල්ලා මේ ප්‍රාදේශීය සභාවට ලැබෙන්න තියෙන වරප්‍රසාද ඉඩම් පවරාදීම සම්බන්ධ කටයුතු සියල්ල ඉටු කර දෙනවා කියලා.මම අවුරුදු 30ක් මේ සභාවට ඇවිත්. ඒ අවුරුදු 30ක කාලය තුළ ඇදගෙන ඇවිත් එතුමාගේ දක්ෂතාවය මත අපට සතුටු වෙන්න පුළුවන්. එතුමිය අපේ සභාපතිතුමා කෙරෙහි කොපමණ පැහැදීමකින් කටයුතු කරනාවද කියන එක මට තේරුණා. ගරු සභාපතිතුමනී, මේ මාස කිහිපය තුළ කරගන්න තියෙන පැවරුම් ටික ප්‍රාදේශීය ලේකම්තුමියට නිතර නිතර කතා කරලා කරගන්න කියන ඉල්ලීම මම කරනවා.

ඒත් එක්කම ගරු උපසභාපතිතුමා හා මන්ත්‍රීතුමන්ලා ස්තුති කලා ධර්ම පුස්ථකය එළි දැක්වීම පිළිබඳව.ශ්‍රී ලංකා ඉතිහාසයේ පන්සල් ඇසුරු කරගෙන මේ කර්තව්‍ය කොපමණ කලත්, පළාත් පාලන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ දුප්පත්ම ප්‍රාදේශීය සභාව හැටියට අපි කරපු දෙයක් බෞද්ධ ධර්මය තියෙන රටක් හැටියට ඔජනංවන්න කරපු මේ වැඩසටහනක්.මාසිකව ධර්ම දේශනාවක් සිදු කරනවා කියන සිතිවිල්ල අපට තිබුණේ නැහැ. මේක භරවත් කරලා ඒකට කටයුතු කරපු අපේ සභාපතිතුමාට සහ ස්තුතිවන්ත වෙනවා මොරගොල්ල අරියරතන නිකේතකාධිපති අපේ කාශ්‍යප හාමුදුරුවන්ට.මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ බදුල්ල දිස්ත්‍රික්කයේ තියෙන හැම පුස්තකාලයකට වගේම විහාරස්ථානයකට මෙම ධර්ම පුස්ථකය ලැබෙන්න සලස්වන්න කියලා. එවිට ඒ ආශ්‍රිතව කටයුතු කරන අය මේ පොත හොඳයි නම් හොයාගෙන ඒවි.එවිට අපි මුදලක් අය කරලා හෝ නොකර හරි නැවත ලබා දෙන්න අපි තීරණය කරන්න ඕන.අපේ මේ වැඩසටහනේ සාර්ථකත්වය බදුල්ල දිස්ත්‍රික්කය පුරාම විදහා පාන්න පුළුවන්.

ගරු සභාපතිතුමනී, අපේ මේ ඉඩමේ වැට ගහන්න හදලා තියෙන ඇස්තමේන්තුවේ මාස පහකට වැඩි වුණු ප්‍රමාණය මේ. ආයතනයක් හැටියට අපට මෙය මෙපමණ දැනෙනවානම් පවුලක් හැටියට ගෘහ මූලිකයාට මෙය කොතරම් දැනෙනවා ඇත්ද?අපේ අගමතැතිමා හොඳ ගමනක් ගියා පහුගිය අවුරුදු 10 තුළ.එතුමාගේ ප්‍රතිරූපය මේ වෙනකොට වෙනස්වීගෙන යනවා. අපි ගම්වල මිනිස්නුට මේක දැනුවත් කරන්න ඕන. ව්‍යාපාරිකයෝ ඩීසල් ගන්න ගියාම සල්ලිකාරයොන්ට හොරෙන් බෙදනවා. අහිංසක දුප්පත් මිනිස්සු පෝලිම්වල. ඒ නිසා මේ පිළිබඳව දැන්වත් කරන්න යම්කිසි වැඩපිළිවෙලක් රටතුළ නිර්මාණය කරන්න ඕන. අපි කාටවත් මහින්ද චින්තනය පිළිබඳව දොස් කියන්න බැහැ. විමල් වීරවංශ මැතිතුමා ඉවත් කරපු දවසේ එතුමා බොහොම වේදනා දනවන විදිහට කතා කලේ. මම කියන්නේ අයින් කරනවා වෙනුවට සියලු දෙනාම එකතුවෙලා මේ ගැටළු නිරාකරණය කරන්න ශක්තිය,ධෛර්යය ලැබෙන්න කියලා. මට හිතෙන්නේ මේ අගෝස්තු වල ඡන්දයක් එනවා කියලා. ප්‍රාදේශීය සභා පනත ගැන පොඩි ප්‍රශ්නයක් තියෙන නිසා අපේ ඡන්දය නම් පවත්වයි කියලා හිතන්න අමාරුයි. අගොස්තු මාසය වෙනකොට අපේ ඡන්දය,පක්ෂය,ආණ්ඩුව හිතේ තියාගෙන එළියට යන්න පුළුවන් වට පිටාවක් හදන්න ඕන කියන එක මම කියනවා. ව්‍යාපාරික ප්‍රජාවගේ තියෙන කූට උපක්‍රම නතර කරන්න පැහැදිලි නිරීක්ෂණයක් කරන්න ඕන කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර රාජපක්ෂ මැතිතුමා: -**

පසුගිය කාලයේ අපේ හිටපු සභා ලේකම් මහතා අපේ වැඩ කටයුතුවලට උදව්කලා.නව සභා ලේකම් මහතාට මම සුභ පතනවා ඉදිරියට වැඩ කටයුතු කරගෙන යන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා: -**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. වසර 25ක් වගේ ප්‍රාදේශීය සභා කාල සීමාව තුළදී ලේකම්වරු/ලේකම්වරියන් හය හත් දෙනෙකු සමඟ මට කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. ඒ ගැන මම සතුටු වෙනවා වගේම මේ සභාවෙත් අවසාන කාලසීමාව තුළදී ගරු සභාපතිතුමා වගේම තරුණ ලේකම්වරයෙක් පත්වෙලා ඇවිල්ලා තියෙනවා. හිටපු ලේකම්තුමාගේ වගේම අලුත් ලේකම්තුමාගේත් කටයුතු එකතු කරලා මේ සභාවේ ඉතාමත් සාර්ථකව කරගෙන යාමට නව ලේකම්තුමාට ශක්තිය,ධෛර්යය ලැබේවා කියලා පතනවා.

ඔබතුමාගේ විශාල උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස පුළුවන් ආකාරයට සහයෝගය ලබා දීලා ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කල ඌවපරණගම ධර්ම දේශනා කෘතිය පසුගියදා නිකුත් කලා. එහිදි විශේෂයෙන්ම සඳහන් කල යුතුයි මහා සංඝරත්නයත් සමඟ මහා විද්වතුන් සම්බන්ධ වුණා. ප්‍රාදේශීය සභාව හැටියට පාර,පීල්ල,තොටුපල,හදනවා වගේම ඌවපරණගම ජනතාවට යම්කිසි දහම් පණිවිඩයක් ලබා දීමට ඒ කෘතිය තුළින් අවස්ථාව ලැබුණා. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. ඔබතුමාගේ නව සංකල්පයකට අනුව ක්‍රියාත්මක කිරිමට අදහස් කරන ප්‍රජා මණ්ඩලය ඌවපරණගම ආසනය තුළ ක්‍රියාත්මක කරලා ඌවපරණගම ජනතාවට සංවර්ධනය හා දේශපාලන කටයුතුවලින් එහාට ගිහිල්ලා මනසට ඒ වගේම දහම් සිතට යම්කිසි මෙහෙවරක් කිරිමට අවස්ථාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් එවැනි සත්කාර්යයන් ඉදිරියට කිරිමට ශක්තිය,ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.කමල් දිසානායක මැතිතුමා: -**

ගරු සභාවෙන් අවසරයි. මේ හැමෝම දන්නවා ඇති මීට දින දෙකකට පෙර හාලිඇල,උඩුවර,7 කණුව ප්‍රදේශයේ හාලිඇල දෙමළ මහා විද්‍යාලයේ 12 වසරේ අධ්‍යාපනය ලැබූ ඩී.විද්‍යා කියන දැරිය අමානුෂික විදිහට වලස්බැද්ද මාර්ගයේදී පොරොවකින් ඔළුව කුඩු වෙන්න ගහලා මරලා දැම්මා. ඒක නිකන්ම ඝාතනයක් නෙවෙයි. අපි ඉතිහාසය තුළ අධ්‍යයනය කලහොත් අපට මතකයි යාපනයේ වින්ද්‍යා,මඩකලපුවේ පාරින්ද්‍යා වයස අවුරුදු හයයි. සේයා වසය අවුරුදු හතයි,පස්සර මඩොල්සිම කාංචනා මනෝහරි.වයස අවුරුදු 17යි. මේ හැමෝම දූෂණය කරලා මරලා දැම්මා.දැන් මේ දවස් දෙකකට පෙර හාලිඇල ප්‍රදේශයේ දී 18 වියැති පාසල් ශිෂ්‍යාව 33 වයසැති තරුණයෙක් විසින් දූෂණය කරලා මරලා දැම්මා. ගරු සභාපතිතුමනී, සූසැට ආභරණයෙන් සැරසුණු පංච කල්‍යානියකට පේදූරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා පහනක් අතේ තියාගෙන යන්න පුළුවන් කියපු රට අද පත්වෙලා තියෙන තැන. හංදියක් හංදියක් ගානේ බෝගස්,බුදු පිළිම,බණ ඇහෙනවා. බණ කියනවා. දානමාන පුණ්‍ය කර්ම කරනවා. ජාත්‍යන්තරයත් පිළිගන්නවා අවිහිංසාවාදය පදනම් කරගෙන පරාර්ථකාමීත්වය සහිත දර්ශනයක් තමයි බෞද්ධ දර්ශනය කියලා. 70%ක් විතර බෞද්ධ මිනිස්සු ඉන්න රටට මොකද වෙන්නේ. අතිශයින්ම කණගාටුදායක සිදුවීමක්. මේ සභාවෙන් මේක ඉස්මතු නොවන්නට සහ මේ සමාජය තුළත් කතාබහ නොවන්නට මාධ්‍ය මේකට දීපු ඉඩ ප්‍රස්ථාව හේතුවන්න ඇති කියලා.

ඒ වගේම මම සිහිපත් කරන්න ඕන යාපනයේ වින්ද්‍යා,පාරින්ද්‍යා වගේම විද්‍යා කියන දියණියත් දමිළ ජාතිකයින්.12 පන්තියේ ඉගෙන ගත්තේ මේ දරුවා. දමිල දරුවෝ උසස් අධ්‍යාපනය හදාරනවා ගොඩක් අඩුයි. ඌවපරණගම ආසනය ගත්තත් දමිල වැඩි කොටසක් ජීවත් වෙනවා. මම හිතන්නේ පාසල් දෙකයි තියෙන්නේ. දමිල දරුවන් සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගන්නවා අඩුයි.7 පන්තියට 8 පන්තියට ගිහින් නතර වෙනවා. මේ ළමයාව පාසල් නිල ඇඳුම පිටින් ඝාතනය කරන්නේ කාන්තා දිනය දවසේ. මේක විශාල ඛේදවාචකයක්. අපේ රටේ දරුවෝ අනාරක්ෂිතයි.මේ සිදුවීම් නැවත නැවත සිදු නොවන්නට දේශපාලඥයෝ විදිහට අපි වගකියන්න ඕන. මොකද මේ රට මේ වගේ තැනකට පත්වුණේ අපි විසින්ම අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක විදිහට. මම විශ්වාස කරනවා කවදාහරි දවසක මේ සමාජය වෙනස් කරන්න ඕන. නැත්නම් මේකට උත්තරයක් නැහැ. මම ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ/වරියන්ගේ,සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේත් ඒවගේම ජනතා විමුක්ති පෙරමුණේ ඌවපරණගම ආසන බල මණ්ඩලයේත් ශෝකය මේ දියණිය වෙනුවෙන් පවුලේ ඥාතීන් වෙත ප්‍රකාශ කර සිටිනවා. කාංචනා මන්ත්‍රීතුමිය පහුගිය සභාවකට යෝජනාවක් ගෙනාවා ළමා හා කාන්තා ආරක්ෂාව සම්බන්ධයෙන් කමිටුවක් හදලා කටයුතු කරමුයි කියලා. ඒවා ක්‍රියාත්මක කරලා මේ දරුවන්ගේ කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කරන වැඩ පිළිවෙලකට යා යුතුයි.

ඒ වගේම ඉන්දන සම්බන්ධයෙන් අපේ රටේ ආන්දෝලනාත්මක සිදුවීමක් ඇතිවෙලා තියෙනවා.ව්‍යාපාර සියල්ල කඩා වැටිලා ඉන්දන ක්‍රමානුකූලව ලබා ගැනීමට නොහැකිවීම තුළ. නමුත් ව්‍යාපාරිකයෝ හිතවත්කම් භාවිතා කරලා ඉන්දන ලබා දෙනවා. මට නිරීක්ෂණය වූ කාරණාවක් තමයි ඔය ඉන්දන පෝලිම්වල දළු එකතු කරන ලොරි හා කිරි එකතු කරන වාහනත් ඔය පෝලිම්වල තිබුණා. අපේ රටට ඩොලර්ගේන ප්‍රධාන කාරණයක් තමයි තේ දළු ව්‍යාපාරය.ආනයනික කිරිපිටි හිඟ වෙලා තියෙන මේ අවස්ථාවේ දේශීය කිරිපිටිවලට යම් තැනක් හැදිලා තියෙනවා. ඒනිසා මෙවැනි අවස්ථාවන් වලදී ඉන්දන ලබාදීමට යම් ක්‍රමවේදයක් සකස් කලා නම් හොඳයි. එවිට තේ දළු ටික එකතු කරන්න,කිරි ටික එකතු

කරගන්න කලට වේලාවට යා හැකියි.ඒ වගේම අපේ නව සභා ලේකම්තුමාට වඩා ඵලදායි මහජන මෙහෙවරක් උදෙසා අපේ පක්ෂයේ කණ්ඩායම විදිහට ඔබතුමාට සුභ පැතුම් පිරිනමනවා. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු සභාපතිතුමා :-**

අද දවසේ න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු පවත්වාගෙන යාමට සහය දැක්වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට පළමුවෙන්ම මගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිනවා.මේ තරම් එකමුතුභාවයක් ලංකාවේ කිසිම පළාත් පාලන ආයතනයක පවතිනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඊට ප්‍රධානම හේතුව ලෙස මම දකින්නේ මට වගේම ඔබතුමන්ලාටත් සැගවුණ දේශපාලන න්‍යාය පත්‍රයක් හෝ පෞද්ගලික න්‍යාය පත්‍රයක් නොමැතිවීම.

අපි ධර්ම පුස්ථකය එළි දැක්වීමේ උළෙල සම්බන්ධයෙන් ඔබලා මනසින් දැක මා ගැන යමක් සඳහන් කලාට මම පෙරළා එය ඔබටම පුජා කරනවා. අපි සභාවේ මන්ත්‍රීවරු බොහොමයක් ධර්ම දේශනා වාරයක් භාර අරගෙන,තේපැන් සංග්‍රහයක් දීලා, ස්වාමීන් වහන්සේ වැඩම කරවලා ධර්ම දේශනාවට අවශ්‍ය පහසුකම් සලසා දුන්නා මේ ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ.එහි ප්‍රතිඵලයක් තමයි අද ධර්ම පුස්ථකයක් බවට පරිවර්තනය වෙලා තියෙන්නේ. උත්සව සභාව වෙනුවෙන් සියලු වියදම් දැරීම ආදි කටයුතු වෙනුවෙන් ප්‍රතිපත්ති තීන්දු වලට දක්වපු සහයටත් ස්තූතිවන්ත වෙනවා.ඒවගේම මේ උත්සවය මේ තරම් දුරට වර්ණවත් කරගන්න ලැබුණේ මාගේ කාර්ය මණ්ඩලය නිසා. ඒ නිසා හිටපු සභා ලේකම්තුමාට,නව සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටම අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ කෘතවේදීත්වය මේ අවස්ථාවේ පුද කරනවා. ඒවගේම මේ කටයුතු සඳහා ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ දායකත්වය සහ අනුශාසකත්වය ඉතාම ඉහලින් ලැබුණා. මහානායක හාමුදුරුවන් වහන්සේ නුවර ඉඳලා තමයි මේ වැඩසටහනට වැඩම කලේ. උන්වහන්සේගේ වැඩමවීමත් ඉතාමත් වැදගත් වුණා. අපේ මේ ධර්ම පුස්ථකය අපේ ආසනයේ තියෙන සියලුම විහාරස්ථානවලට බෙදා හැරීමට කටයුතු කරනවා. මුද්‍රණය කල පොත් ප්‍රමාණවත් නොවන්නේ නම් තමන්ට ලැබෙන සභා අරමුදලින් හරි පොත් මුද්‍රණය කරමුයි කියන උප සභාපතිතුමාගේ වචනයට මම සන්තෝෂ වෙනවා.මට ලැබුණ සභා අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් වියදම් කරලා තියෙන්නේ දහම් පාසල්වලට සහ පෙර පාසල්වලට.අපි ප්‍රතිපත්ති ගරුක විදිහට අපේ සභා අරමුදල් වලිනුත් යම් ප්‍රතිශතයක් වියදම් කරලා තියෙනවා මේ සඳහා. ඒක අඛණ්ඩව ඉදිරියට කරගෙන යන්න බලාපෙරොත්තු වෙනවා. .

දැන් මීනී මැරුම් ඕන තරම් සිද්ධ වෙනවා. මාධ්‍ය ඒවා මාකටින් කරනවා. ඒ දවස්වල අපිට ශ්‍රීලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් තමයි අහන්න ලැබුණේ. රූපවාහිනි හැම ගෙදරකම තිබුණේ නෑ.සන්නිවේදනය මේ තරම් වේගවත් වුණේ නැහැ. උදාහරණයක් විදිහට එදා සමන් කුමාර කියන මතුගම දරුවෙක් මරපු වෙලාවේ කැසට්පට කවිකොල ගහලා ගමයි සමාජගත කලේ. ඒ වගේම කතරගම රූපරැජිණි මනම්පේරි ඝාතනය කල සිද්ධිය සාහිත්‍යයට නැගුණා ගීතයක් ලෙස. අපේ රටේ උතුරේ දැවැන්ත යුද මානසිකත්වයකට රට ගොඩ නැගිලා තිබුණා.දකුණේ සන්නද්ධ කැරලි දෙකකට යොමු වුණා. මේ හරහා ජනතාවගේ මනස විකෘතිවීම් සහ ආර්ථික පීඩනත් බලපාලා තියෙනවා. මුළු සමස්ත සමාජ ක්‍රමයම වෙනස් කිරීමට අපේ දායකත්වය දරන්න ඕන. විනයගරුක වෙන්න ඕන.

අද ගුරුවරයාට අපි ඉගෙන ගන්න කාලයේ තිබුණ සැලකිල්ල භක්තිය අද නැහැ. ගුරුගෝල සම්බන්ධතාවය ගොඩ නැගෙන්නේ නැහැ. පන්තියේ ගුරුවරයාට අපි ගාස්තුවක් ගෙවලා හවස පාසලෙන් එළිය තැනක උගන්වන්න ඕන. අදටත් මා ගාව සිහිවටනයක් තියෙනවා උසස් පෙළ කරන කාලයේ පෞද්ගලිකව ගිහින් ඉගෙන ගන්න සල්ලි නැති නිසා ගණකාධිකරණය සම්බන්ධයෙන් මේ ප්‍රදේශයේ හිටපු දක්ෂම ගුරුවරයා ප්‍රේමරත්න සර් මට පන්ති යන්න නිදහස් ප්‍රවේශ පත්‍රයක් හදලා දුන්නා. අද ගොඩ නැගෙන ගුරු ගෝල සම්බන්ධතාවය බොහෝ දුර එකක්. අද එතනින් එළියට යන දරුවාට ධර්මතා අඩුයි. අද ස්මාර්ට් ජංගම දුරකතන හරහා සන්නිවේදනය වේගවත් වෙලා තියෙනවා. අද 4,5 පන්තියේ ඉන්න ළමුන් පවා ස්මාර්ට් ජංගම දුරකතන භාවිතා කරනවා. දේශ සීමා මායිම් වලින් ඔබ්බට ගිය සමාජ විපර්යාසයක් බවට පරිවර්තනය වෙලා තියෙනවා මුළු ලෝකයම. එදා කොළඹ අදින ඇඳුමක් අගුණුකොල පැලැස්සට,ඌවපරණගමට එන්න කොළඹ ගිහිල්ලා බලලා එන්නම ඕන. එහෙත් අද ලොස්ඇන්ජලිස්වල අදින ඇඳුමක් තත්පරයක් යනකොට අගුණුකොලපැලැස්සට එනවා මේ තාක්ෂණය හරහා.අද ලෝකය විශ්ව පවුලක් බවට පත්වෙලා තියෙනවා. ඒ තුල සාරධර්ම,ධර්මතා ආරක්ෂා කර ගැනීම අසීරු කාර්යයක්.

තව දින කිහිපයකින් ලුණුවත්ත නගරය තුළ ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ නව වෙළඳ සංකීර්ණය සඳහා මුල්ගල් තියන්න බලාපොරොත්තු වෙනවා. පැරණි වෙළඳ සංකීර්ණය කඩා ඉවත් කිරිමට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ බලපත්‍රය අරගෙන කටයුතු කරමින් පවතිනවා.ප්‍රාදේශීය සභාවක් විදිහට ලුණුවත්ත නගරයේ PMTමහත්තයා හිටපු දවස්වල හදපු කඩ පේලිය තමයි අදටත් තියෙන්නේ.ඒ නිසා මෙය ලුණුවත්ත නගරයට ලොකු එළියක් වැටෙන වැඩක්.

පහුගිය දවසක පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීවරියන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර දුන්නා. අපේ සභාවට ලැබුණේ නැහැ. ඒකට හේතුව දන්නේ නැහැ. අපේ සභාවේ තමයි හිටපු සභාපතිවරියක්,දිස්ත්‍රික්කයේ පැරණිම මන්ත්‍රීවරියක් හා තවත් මන්ත්‍රීවරියන් රාශියක් ඉන්නේ.ඔබතුමියලාගේ කවයක් හදලා තියෙනවා CDLG ව්‍යාපෘතිය හරහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිතව. ඔබතුමියන්ලාගේ ගෞරවය අඩු කරලා නැහැ මම කොතනකදීවත්. මම අනවශ්‍ය විදිහට නිලධාරින් ළඟට ගිහින් බලපෑම් කරන්නේ නෑ. මට ප්‍රතිපත්තිගරුක භාවයක් තියෙනවා. ඉහල නිලධාරින් දන්නවා හොඳ සභාව මොකක්ද අඩුපාඩු තියෙන සභාව මොකක්ද කියලා. අපේ සභා වාර්තාව බැලුවම අපි ගොඩක් දේවල් සම්මත කරගෙන තියෙන්නේ ඒකමතිකව. ඒ එකඟතාවයකට ගරු කරලා සලකන්න ඕන.

අපේ අයවැයෙන් ශීර්ෂගතව වෙන් කරලා තියෙනවානේ කාන්තා වැඩසටහනක් සඳහා.ඒ වැඩසටහන සඳහා ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරමු. රටේ තියෙන යම් යම් ආර්ථික දුෂ්කරතාවයන් හා හිඟතාවයන් කළමනාකරණය කර ගනිමින් අපි යම් යම් තීන්දු තීරණ ගන්නවා.A4 ඉතිරි කරගන්න අපි සමිති සියල්ලටම ලිපි ලබා නොදි සමිති දැනුවත් කිරිම සඳහා කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට ලිපිය බැගින් ලබා දෙනවා. ලුණුවත්ත නගරයේ සහ අඹගස්දෝව නගරයේ විපීපහන් නිවා දමන්න සිදුවුවහොත් ඒ කටයුත්ත සිදු කරන බව දන්වා සිටිනවා රටේ තියෙන තත්ත්වය අනුව.

අද දවසේ මේ කටයුත්ත සඳහා දායකත්වය,සහයෝගය සපයමින් කටයුතු අවසන් කර ගැනීම සඳහා ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී තුමන්ලා/තුමියන්ලා සියලුම දෙනාටත්, සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,ජොෂ්ඨ මාධ්‍යවේදී රාජමන්ත්‍රී මහතාටත් මගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිනවා.

ඒ අනුව පෙ.ව.11.30 ට ගරු සභාපතිතුමා විසින් සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ස්තූතියි.

මෙයට
විශ්වාසී,

සමින්ද සුදර්ශන කුරුප්පුආරච්චි,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

මෙම සභා වාර්තාව ...................... වන දින පැවති මහ සභාවේදී ..................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ යෝජනාවෙන් ................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/සංශෝධනයට යටත්ව සභා සම්මත විය.